# පුරාතන අවධියේ ශ්‍රී ලංකා සමාජයේ පැවති අවමංගල්‍ය චාරිත්‍ර පිළිබඳ විමසුමක් (සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින්)

එස්. ඩබ්. සුපුන් ගයාන් විජේරත්න[1]

## හැඳින්වීම

අස්පර්ශනිය සංස්කෘතික උරුමය යනු ප්‍රජා කණ්ඩායම් හෝ පුද්ගලයින් තමන්ගේ සංස්කෘතික උරුමයේ කොටසක් ලෙස හඳුනාගනු ලබන ක්‍රියාකාරකම්, නියෝජනයන්, ප්‍රකාශනය, දැනුම කුසලතා මෙන් ම ඒ හා සම්බන්ධ වූ උපකරණ, භාණ්ඩ, කෞතුක භාණ්ඩ, සංස්කෘතික කලාප ආදිය වේ. අස්පර්ශනීය සංස්කෘතික උරුමයට අයත් විවිධ අංශ කීපයක් පවතින අතර සිරිත් විරිත් එහිදී ප්‍රධාන අවස්ථාවකි. පුරාතන ශ්‍රී ලංකාවේ සමාජය තුළ මුල්බැසගෙන පැවති සිරිත් විරිත් ගණනාවක් හඳුනාගත හැකි අතර සාහිත්‍යමය මෙන් ම පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ විමසන විට අවමංගල්‍ය චාරිත්‍ර මුල් කාලීන අවධියේ සිටම මෙරට සමාජයේ ක්‍රියාත්මක වූ බව දක්නට ලැබේ. මියගිය ඥාතීන් තමන් දෙස බලා සිටින බවද, දෛනික කටයුතුවල සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය කෙරෙහි බලපෑම් කිරීමට ඔවුන්ට හැකියාවක් ඇති බවට ද පැවති විශ්වාසය මත මුල් කාලීනව අවමංගල්‍ය චාරිත්‍ර ආරම්භ වී පසුකාලීනව ආගමික විශ්වාසයන්හි ආභාසයෙන් අවමංගල්‍ය චාරිත්‍ර සංවිධිත හා සංකීර්ණ විය. මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස පුරාතන අවධියේ ශ්‍රී ලංකා සමාජයේ පැවති අවමංගල්‍ය චාරිත්‍ර මොනවාද ? යන්න හඳුන්වාදිය හැකි ය.

පුරාතන අවධියේ ශ්‍රී ලංකා සමාජයේ පැවති අවමංගල්‍ය චාරිත්‍ර පිළිබඳ අධ්‍යයනයන් කීපයක් සිදු වී ඇති බව හඳුනාගත හැකි ය. හේම එල්ලාවල මහතා විසින් 1962 වසරේදී ප්‍රකාශයට පත්කළ පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය කෘතිය, ඇම්. බී. ආරියපාල මහතා විසින් 1962 වසරේදී ප්‍රකාශයට පත්කළ මධ්‍යකාලීන ලංකා සමාජය කෘතිය, විල්හෙල්ම් ගයිගර් මහතා විසින් 1969 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය කෘතිය, ඇස්. බී. හෙට්ටිආරච්චි මහතා විසින් 2008 වසරේදී ප්‍රකාශයට පත්කළ ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය කෘතිය වැනි කෘති විමසන විට මේ පිළිබඳ සංක්ෂිප්තව අවධානය යොමුකර ඇති බව දක්නට ලැබේ. මෙම අධ්‍යයනයන්හි සාකච්ඡාවන් ආශ්‍රය කර ගනිමින් ද එකී පර්යේෂණයන්හිදී අවධානය යොමු වී නොමැති අවකාශයන් පිළිබඳ අවධානය යොමු කරමින් ද ප්‍රාථමික මූලාශ්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නව තොරතුරු හඳුනාගනිමින් පුරාතන ශ්‍රී ලංකාවේ අවමංගල්‍ය චාරිත්‍ර පිළිබඳ තවදුරටත් සියුම්ව විමර්ශනය කිරීමට මෙහිදී ක්‍රියාකරනු ලැබේ.

මෙම පර්යේෂණයේදී ප්‍රාග්ඓතිහාසික යුගයේ සිට මෙරට සමාජයේ අවමංගල්‍ය කටයුතු හා සම්බන්ධ චාරිත්‍ර පැවතගෙන පැමිණි ආකාරය විමසා බැලීම ද, ඓතිහාසික

1. තාවකාලික කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
gayand02i83@gmail.com

අවධියේ මෙරට සමාජය තුළ අවමංගල්‍ය සිරිත් විරිත් මුල්බැසගෙන තිබූ ආකාරය හා ඒවා ප්‍රායෝගිකව කෙබඳු ස්වරූපයක් ගත්තේ ද යන්න විමසා බැලීම ද, අවමංගල්‍ය චාරිත්‍රවලට සමාජය තුළ හිමි වූ වැදගත්කම හා ඒවා මගින් සමාජයට සිදු වූ බලපෑම කෙබඳු වී ද යන්න විමසා බැලීම ද අරමුණු වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ දී ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරන ලදි. එහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට සඅනුගත ව පුස්තකාල පර්යේෂණ ඔස්සේ ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීමත් ද්විතියීක මූලාශ්‍රය පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීමත් අනතුරුව ක්‍රමානුකූලව පෙළගැස්වීම සිදු කළ අතර පසුව නිගමනවලට එළඹීම සිදු කරන ලදි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ප්‍රාග්ඓතිහාසික යුගයේ පැවති අවමංගල්‍ය චාරිත්‍ර විමසන විට මියගිය ඥාතීන්ට තම කටයුතු කෙරෙහි බලපෑම් කිරීමට හැකි බවට පවතින විශ්වාසය මත මළවුන් කෙරෙහි විවිධ චාරිත්‍ර අනුගමනය කර තිබෙන ආකාරය හඳුනාගත හැකි ය. මෙහි දී නමා හකුලා වළ දැමීම, හිස බටහිර දෙසට සිටින සේ වළ දැමීම, මස් දිය වූ අස්ථිවල ගුරු ගල් ආලේප කිරීම, හිස් කබල සිදුරු කිරීමට උත්සාහ කිරීම වැනි අවස්ථාවන් හඳුනාගත හැකි වේ. පූර්ව ඓතිහාසික යුගය විමසන විට විධිමත් භූමදාන ක්‍රමවේද හා සුසාන චාරිත්‍ර ක්‍රියාත්මක වූ අතර සුසාන ආකෘති කීපයක අවශේෂ හමුවේ. එහිදී මැටි ඔරු සුසාන, ශිලා මංජුසා සුසාන, ශිලා මණ්ඩල සුසාන, ශිලා කේතුක සුසාන, ශිලා පෙළ සුසාන, ඍජුකෝණාස්‍රාකාර සුසාන, හරණි සුසාන, සුසාන තැන්පතු වැනි සාධක හමුවේ.

ඓතිහාසික යුගයේ පැවති අවමංගල්‍ය චාරිත්‍ර විමසන විට බුදු දහම හඳුන්වා දීමට පෙර යුගයේදී ඇදහිලි, විශ්වාස මෙන් ම බ්‍රාහ්මණ, ජෛන වැනි ආගමික සම්ප්‍රදායන් පදනම් කරගෙන අවමංගල්‍ය චාරිත්‍ර පැවති බව පෙනේ. පෙර කල මිය ගොස් යක්ෂයන් ලෙස උපත ලබා සිටි තමාට උපකාර කළවුන්ට පණ්ඩුකාභය රජු දේවාල ඉදිකිරීම, යක්ෂයන් ලෙස උපත ලබා සිටි ඇතැමුන්ට අවුරුදු පතා "බලි දානය" දීම, සමාජ තත්ත්වය අනුව සුසාන වර්ග තිබීම, සුසානවල කටයුතු සඳහා සැඩොල් කුලයේ පුරුෂයන් පත් කිරීම වැනි අවස්ථා පිළිබඳ ඉදිරිපත් වන අතර බුදු දහම හඳුන්වා දීමෙන් පසු අවධිය විමසන විට බුදු දහමේ ආභාසයෙන් අවමංගල්‍ය චාරිත්‍ර සංවිධිත හා සංකීර්ණ වෙමින් වර්ධනය වූ ආකාරය දක්නට ලැබේ. මිහිඳු හිමි හා සංඝමිත්තා තෙරණිය පිරිනිවන් පෑමෙන් පසුව අනුගමනය කළ කටයුතු අදියෙන් භික්ෂූන් අපවත් වූ පසු අනුගමනය කළ චාරිත්‍ර පිළිබඳ හඳුනාගත හැකි අතර පාලකයන් මියගිය පසු අනුග මනය කළ චාරිත්‍ර ද හඳුනාගත හැකි ය. සාමාන්‍ය ජනතාව අනුගමනය කළ චාරිත්‍ර විමසන විට මරණාසන්න චාරිත්‍ර විධි කීපයක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් වේ. මරණාසන්නයේදී දෙනු ලබන දානය, ආසන්න කර්ම, ජීවහත්ත දානය ආදිය මෙන් ම ඇතැම් ප්‍රදේශවල ගවයන් දන්දීම හා ඇතැම් ප්‍රදේශවල භික්ෂූන් වහන්සේ නමකට රෙදි කඩක් පූජා කිරීම, යහපත් සිතිවිලි ඇති කරවීමට කටයුතු කිරීම, පෙර කරන ලද පුණ්‍ය කර්ම සිහිපත් කරවීම, භික්ෂූන් ලවා පිරිත් සජ්ඣායනා කරවීම, ඇඳ අසල අලංකාර මල් තැබීම

ආදිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් වන අතර මියගිය පසු අනුගමනය කළ චාරිත්‍ර පිළිබඳ ඉදිරිපත් වන තොරතුරු විමසන විට හිස බස්නාහිරට හැරවීම, දේහය අසළින් පහනක් පත්තු කිරීම, දෑත් එකතුකර පපුව මත තැබීම, බුලත් කොළ කනපිට හැරවීම, මියගිය තැනැත්තාට අවසන් ගෞරව දැක්වීම, විවිධ ද්‍රව්‍ය මළ ගෙදරට රැගෙන යාම, හේවිසි ගැසීම, පැන් වැඩීම, පෙරහැරකින් සුසානය කරා දේහය රැගෙන යාම, සොහොන් කඩක් මිණීවළ මත සිටුවීම, මියගිය තැනැත්තාට පිං අනුමෝදන් කිරීමට භික්ෂූණ් ලවා බණ කියවීම, දන්දීම අදිය සිදුකළ බව මූලාශ්‍රය ඇසුරින් හඳුනාගත හැකි ය.

හින්දූන් අනුගමනය කළ චාරිත්‍ර විමසන විට ආදාහනය කිරීම, මරණින් මතු ජීවිතය යහපත් කර ගැනීමට මන්ත්‍ර හා ගීතිකා ගායනා කිරීම ආදිය හඳුනාගත හැකි අතර ඉස්ලාම් ආගමිකයන්ගේ චාරිත්‍ර විමසන විට අරාබි අක්ෂර සහිත අභිලේඛනමය පාඨ අන්තර්ගත ඉස්ලාම් ආගමිකයන්ගේ සොහොන් කොත් පිළිබඳ ක්‍රි. ව. 10, 15 සියවස්වලට අයත් සාධක දිවයිනේ විවිධ ප්‍රදේශවලින් හමු වී තිබේ.

පුරාතන ශ්‍රී ලංකාවේ අවමංගල්‍ය චාරිත්‍රවලට සමාජය තුළ හිමි වූ වැදගත්කම හා ඒවා මගින් සමාජයට සිදු වූ බලපෑම විමසන විට අවමංගල්‍ය චාරිත්‍ර අත්‍යවශ්‍ය අවස්ථාවක් ලෙස සමාජය තුළ ස්ථාපිත වීම, භික්ෂු සංස්ථාව, රජ මැදුර ආදියේ සිට සාමාන්‍ය වැසියා දක්වා සමාජ ස්ථර අතර අවමංගල්‍ය චාරිත්‍රවලට සැළකිය යුතු වැදගත්කමක් හිමි වීම, මෙරට සංස්කෘතිය තුළට නවාංග රාශියක් එකතු වීම, සමාජය සදාචාර සම්පන්න වීම කෙරෙහි සෘජුව මෙන් ම වක්‍රව බලපෑම, එකිනෙකා අතර අන්‍යෝන්‍ය සබඳතාව, සුහදතාව, ගෞරවය වර්ධනයට හේතු වීම, ආගමික පක්ෂය හා සාමාන්‍ය ජනතාව අතර සබඳතාව වැඩි වීම, නූතනය දක්වාම ප්‍රගතිගාමී අයුරින් සමාජය කෙරෙහි බලපෑම වැනි තත්ත්වයන් ගණනාවක් හඳුනාගත හැකි ය.

**නිගමනය**

අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් අතර චාරිත්‍ර වාරිත්‍ර ප්‍රමුඛ අවස්ථාවක් වන අතර මියගිය ඥාතීන් තමන් දෙස බලා සිටින බව ද, දෛනික කටයුතුවල සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය කෙරෙහි බලපෑම් කිරීමට ඔවුන්ට හැකියාවක් ඇති බවට ද පැවති විශ්වාසය මත මුල් කාලීනව අවමංගල්‍ය චාරිත්‍රයන් ආරම්භ වූ ආකාරය හඳුනාගත හැකි ය. ප්‍රාග්ඓතිහාසික අවධිය විමසන විට ප්‍රාථමික හා සරල අවමංගල්‍ය චාරිත්‍ර පිළිබඳ තොරතුරු පුරාවිද්‍යාත්මක සාධක ඇසුරින් ඉදිරිපත් වන අතර ඓතිහාසික අවධිය විමසන විට මහින්දාගමනයට පෙර අවධියේ පැවති ඇදහිලි හා විශ්වාස මෙන් ම බ්‍රාහ්මණ, ජෛන වැනි ආගමික විශ්වාස පදනම් කොටගෙන පැවති බව හඳුනාගත හැකි ය. මෙරටට බුදු දහම ලැබීමෙන් අනතුරුව ඒ හා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර ව්‍යාප්ත වීම නිසා අවමංගල්‍ය චාරිත්‍රයන් ද ඒ අනුව සකස් වූ බව මූලාශ්‍රයගත තොරතුරු අනුව පැහැදිලි වේ. බෞද්ධයන්ට අමතර ව හින්දු ආගමිකයන් සහ ඉස්ලාම් ආගමිකයන් විවිධ අවමංගල්‍ය චාරිත්‍ර අනුගමනය කළ බව හඳුනාගත හැකි අතර අවමංගල්‍ය චාරිත්‍ර මෙරට සංස්කෘතියේ ප්‍රගතිගාමී අයුරින් ක්‍රියාත්මක වෙමින් පසුකාලීන අවධිය කෙරෙහි ද බලපෑම් සහගත තත්ත්වයක් ඇති කළ බව හඳුනාගත හැකි ය.

**මුඛ්‍ය පද:** අවමංගල්‍ය චාරිත්‍ර, අස්පර්ශනීය උරුම, පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර, සංස්කෘතිය, සමාජය, සාහිත්‍යමය මූලාශ්‍රය

## ආශ්‍රිත ග්‍රන්ථ


*පූජාවලිය*. (1951). (සංස්.) කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*මහාවංසය*. (2012). (සංස්.) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ පඬිතුමන්, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යාස්ථානය.

*රසවාහිනී*. (1961). (සංස්.) කිරිඇල්ලේ ඥාණවිමල හිමි. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*සද්ධර්මරත්නාවලිය*. (1985). (සංස්.) ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපාකාර සමාගම, කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

*සද්ධර්මාලංකාරය*. (1953). (සංස්.) කලුතර සාරානන්ද හිමි, කොළඹ: රත්නාකර පොත් වෙළඳ ශාලාව.

එල්ලාවල, හේම. (1962). *පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය*. කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

සෝමතිලක, මහින්ද. (2015). *පැරණි ශ්‍රී ලාංකේය සමාජය වාර්ගිකත්වය, සංස්කෘතිය සහ ආගම*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.